᠎# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,767 - 2012 ජූලි මස 13 වැනි සිකුරාදා - 2012.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 710 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 712 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | –– |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 712 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 713 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අගෝස්තු මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජූලි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2012 ජූනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2012 අංක 534

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

*2012 ජුනි මස 01 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :*

නි/3977 කපිතන් බීආර්ඩී මෙන්ඩිස්
නි/4519 කපිතන් පීකේකේ ගංගා
නි/5262 කපිතන් කේජ්පී රත්නායක
නි/5682 කපිතන් එස්එස්සී ආරියනන්ද
නි/5707 කපිතන් ඩබ්එස්එන් විතාන
නි/5922 කපිතන් එම්ජ්ජ් ප්‍රියන්කර
නි/5925 කපිතන් කේකේඕ ජයදේව
නි/5926 කපිතන් එම්ආර්පී මායාදුන්නේ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ,
කොළඹ දී ය.

07-306

---

2012 අංක 535

D/RF/RECT/954/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද සේවා කාලය දීර්ඝ කිරීමක්

පහත නම සඳහන් නිලධාරියාගේ නිත්‍ය නාවික හමුදාවේ සේවා කාලය 2012 ජූලි මස 12 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වසරකින් දීර්ඝ කෙරේ :

රියර් අද්මිරාල් සමරසිංහ ආරච්චිගේ මැක්සිමස් ජයන්ත පෙරේරා, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී - එස්එල්එන් - එන්ආර්එක්ස් 0140

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ජුනි මස 14 වැනි දින,
කොළඹ දී ය.

07-441

---

2012 අංක 536

D/AF/866.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2011 අප්‍රේල් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ස්කොඩ්රන් ලීඩර් හේරත් මුදියන්සේලාගේ චින්තක දේවේන්ද්‍ර හේරත් (01892) - මෙහෙයුම් ගුවන්

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ දී ය.

07-307

---

2012 අංක 537

D/AF/886.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2011 ජූලි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මංජුල රමේෂ් විජේගුණසේකර (02602) - කාර්මික ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

07-304

2012 අංක 538

D/AF/885.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2011 ජූලි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ටික්කමගේ තිලංග සජිත් පෙරේරා (02763) - විද්‍යුත් ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

07-310

---

2012 අංක 539

D/AF/887.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2011 ජූලි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ෆ්ලයිට් ඔෆිසර් ලොකු මරක්කලගේ දිනේෂ් ලක්මාල් (02766) - විද්‍යුත් ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

07-309

---

2012 අංක 540

D/AF/865.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන අධිකාරියෙන් ඉල්ලා අස්වීම

2011 අප්‍රේල් මස 01 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියාගේ ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

| *නිලය* | *සම්පූර්ණ නම* | *ශාඛාව* |
|---|---|---|
| ස්කොඩ්‍රන් ලීඩර් | ගමගේ දර්ශන කමල් වීරසේන (වී/0201) | වෛද්‍ය |

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ දී ය.

07-308

---

2012 අංක 541

D/AF/863.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන අධිකාරියෙන් ඉල්ලා අස්වීම

2011 මාර්තු මස 10 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියාගේ ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

| *නිලය* | *සම්පූර්ණ නම* | *ශාඛාව* |
|---|---|---|
| ප්ලයින් ඔෆිසර් | ටිකිරියාදුර රවින්ද්‍ර සොයිසා (වී/0448) | නියමු පොදු රාජකාරි |

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 මාර්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

07-303

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2012 අංක 542

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ, ඩී. එල්. පී. ආර්. අභයරත්න මහතා 2012 පෙබරවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු වැඩබලන තැපැල්පති වශයෙන්.

07-438/1

2012 අංක 543

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I වැනි පන්තියේ, පී. සන්දිරසේගරම් මහතා 2012 මාර්තු මස 27 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි නැවත නියමයක් කරනතුරු රජයේ ප්‍රධාන තක්සේරුකරු වශයෙන්.

07-438/2

2012 අංක 544

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ, එම්. ඒ. එස්. වීරසිංහ මහතා, 2012 මැයි මස 14 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි නැවත නියමයක් කරනතුරු ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වශයෙන්.

07-438/3

# රජයේ නිවේදන

අංකය : ප්‍ර.නො. 11/2/20/2012 පිටු සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවල අදාළ පළමු වන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2012.07.13 වැනි දින සිට 2012.07.27 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2012.08.03 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| --- | --- | --- |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී දරන කොට්ඨාසයේ 1319 වෙළුමේ 147 පත්ඉරුව. | වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වල්ගම්පත්තු කෝරළයේ දේවමැදි හත් පත්තුවේ කෙළිමුණේ පිහිටි කෙළිමුණේ වත්ත නැමති ඉඩමේ කැබලි අංක 03ට එච්. බී. හේරත් මානක තැන විසින් 2007.06.25 වැනි දින මැන සාදන ලද අංක 06/07 දරන පිඹුරට ප්‍රකාර මායිම්, | 01. කේ. ඒ. කිත්සිරි සේනාරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2007.11.05 වැනි දින අංක 1152 දරන විකුණුම්කරය |

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | *උතුරු නැගෙනහිර සහ නැගෙනහිරට* : එකී අංක 06/07 දරන පිඹුරේ කැබලි අංක 02.<br>*දකුණට* : පුත්තලම් පාරේ සිට මගුරු ඔයට යන ප්‍රාදේශීය සභා පාර.<br>*බස්නාහිරට* : බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර මහතාගේ අංක 481ඒ/පී සහ 1978.12.04 දින දරන පිඹුරේ කැබලි අංක 06 සහ 07 සහ අඹගහමුල කැල්ල.<br>*උතුරු-බස්නාහිරට* : අඹගහමුල කැල්ල සහ පින්කුඹුර.<br>ප්‍රමාණය : අ.0, රූ.02, පර්.20.675. | |

07-375

---

### 1985 අංක 40 දරන මිනිස්බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, 1985 අංක 40 දරන මිනිස්බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනතේ 37(I) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත දැක්වෙන බලඇණිය, 2012 අප්‍රේල් මස 30 වැනි දින සිට ජාතික ශිෂ්‍යභට බලකායේ බලඇණියක් වශයෙන් නගා සිටුවා ස්ථාපිත විය යුතු බව මෙයින් නිශ්චය කරමි.

22 වැනි බලඇණිය - ජාතික ශිෂ්‍යභට බලකාය.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 දින,
කොළඹ දී ය.

07-305

### වන්දනා ගමන් ආඥාපනත

මාතර අප ස්වාමිදූවගේ සිද්ධස්ථානයේ වාර්ෂික උත්සවය

මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර අප ස්වාමිදූවගේ සිද්ධස්ථානයේ (මාතර මෑණියන්ගේ දේවස්ථානයේ) වාර්ෂික මංගල්‍යය 2012 සැප්තැම්බර් මස 07 වැනි සිකුරාදා දින සිට සැප්තැම්බර් 09 වැනි ඉරු දින දක්වා පැවැත්වෙන බව (175 වැනි අධිකාරය වන) වන්දනා ගමන් ආඥාපනත යටතේ සකස් කර 1991 නොවැම්බර් මස 01 වැනි දින හා 687 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන රෙගුලාසිවල 2 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

බී. රණවීර,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2012 ජුනි මස 18 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-259

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පී වී 61479.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394(3) වගන්තිය යටතේ ''තාසිම් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "2007.09.21" දින සංස්ථාපිත සමාගමක් වන "තාසිම් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "තාසිම් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 ජුනි මස 22 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-341

පී වී 8287.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''ඩී පී ඕ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "2004.02.09" වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ඩී පී ඕ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ඩී පී ඕ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 ජූනි මස 22 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-342

---

පී වී 60102.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''ට්‍රේඩ් බේස් ලංකා ගෘප් ඔෆ් කම්පැනීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "2007.05.30" වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ට්‍රේඩ් බේස් ලංකා ගෘප් ඔෆ් කම්පැනීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ට්‍රේඩ් බේස් ලංකා ගෘප් ඔෆ් කම්පැනීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 ජූනි මස 22 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-343

---

පී වී 61953.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''ලයිම් ලයිට් කම්ෆෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ "2007.11.06" වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ලයිම් ලයිට් කම්ෆෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ලයිම් ලයිට් කම්ෆෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 ජූනි මස 20 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-344

---

**හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. - රාගම ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වනවගන්තිය යටතේ හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ග්රෑන්ඩ් අපාර්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2012.05.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

"හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. විසින් ග්රෑන්ඩ් අපාර්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සපයන ලද ණය මුදල් ආපසු ගෙවන බවට සුරැකුමක් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොලුව විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2007.09.28 වැනි දින අංක 2191 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අදිකාරි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2008.10.10 වැනි දින අංක 355 දරන බැඳුම්කරයන් ග්රෑන්ඩ් අපාර්ට්මන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට සහ නයිනායක මුදියන්සේලාගේ නුවන් සමන්ත බණ්ඩා හෙවත් නයිනායක මුදියන්සේලාගේ නුවන් සමන්ත බණ්ඩාර සහ කොන්ගනිගේ මයුරි චන්දිමා ක්‍රිෂානි ඇන්තනී යන අයවළුන් උකස්කරුවන් හැටියට හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. වෙත උකස් කර ඇති හෙයින්,

ඉහත කී නයිනායක මුදියන්සේලාගේ නුවන් සමන්ත බණ්ඩා හෙවත් නයිනායක මුදියන්සේලාගේ නුවන් සමන්ත බණ්ඩාර සහ කොන්ගනිගේ මයුරි චන්දිමා ක්‍රිෂානි ඇන්තනී යන අයවළුන් එකී ග්‍රෑන්ඩ් අපාර්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයන් වශයෙන් එම සමාගමේ පාලනය හා කළමණාකරණය දරන අතර, ඒ අනුව එකී නයිනායක මුදියන්සේලාගේ නුවන් සමන්ත බණ්ඩා හෙවත් නයිනායක මුදියන්සේලාගේ නුවන් සමන්ත බණ්ඩාර සහ කොන්ගනිගේ මයුරි චන්දිමා ක්‍රිෂානි ඇන්තනී යන අයවළුන් ඉහත කී ග්‍රෑන්ඩ් අපාර්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අත්‍යථ අයිතිකරු හා පාලනය දරන තැනැත්තන් වන අතර, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් ග්‍රෑන්ඩ් අපාර්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්ට සැපයූ මූල්‍ය පිළිසරණයන්හි නියම අර්ථලාභියා එකී නයිනායක මුදියන්සේලාගේ නුවන් සමන්ත බණ්ඩා හෙවත් නයිනායක මුදියන්සේලාගේ නුවන් සමන්ත බණ්ඩාර සහ කොන්ගනිගේ මයුරි චන්දිමා ක්‍රිෂානි ඇන්තනී යන අයවළුන් වන හෙයින් ද,

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු මුදල් ආපසු ගෙවීම ග්‍රෑන්ඩ් අපාර්ට්මන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ නයිනායක මුදියන්සේලාගේ නුවන් සමන්ත බණ්ඩා හෙවත් නයිනායක මුදියන්සේලාගේ නුවන් සමන්ත බණ්ඩාර සහ කොන්ගනිගේ මයුරි චන්දිමා ක්‍රිෂානි ඇන්තනී යන අයවළුන් විසින් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් පනස් හතර ලක්ෂ හැටදෙදහස් එකසිය විසිහයයි ශත හැත්තෑ අටක (රු. 5,462,126.78) මුදලක් 2012.02.29 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,462,126.78ක මුදලට 2012.03.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2191 සහ 355 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී ".

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (ගම්පහ කොට්ඨාසය තුළ ලියාපදිංචි වී ඇති) අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය සභාවට අයත්, රාගම ඒකකය තුළ රාගම පිහිටි තේවත්ත පාර, වරිපනම් අංක 87/16 දරන "දෙල්ගහවත්ත" හෙවත් "අඹගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද 1971 ජනවාරි මස 26 වැනි දින සහ අංක 1776A දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 3 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : දැනට විවියන් ගුණසේකර සහ අනෙක් අය උරුමකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : ලොට් 2 න්ද, නමුත් වඩාත් නිවැරදි ලෙස දැනට විවියන් ගුණසේකර සහ අනෙක් අය උරුමකම් කියන ඉඩමෙන් ද, දකුණට : කේ. පී. සිල්වා හිමිකම් කියන එම ඉඩමේම ලොට් සී වලින් ද, නමුත් වඩාත් නිවැරදි ලෙස ලොට් 4න් ද, සහ බස්නාහිරට : දුම්රිය මාර්ගයට වෙන්කරන ඉඩමෙන් ද, නමුත් වඩාත් නිවැරදි ලෙස ලොට් 2න් ද, මායිම් වූ එකී අංක 1776 A දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහත (අ. 0 රූ. 0 පර්. 17) ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග පිහිටි ඉඩම වේ.

ඉහත විස්තර කරන ලද ඉඩම නැවත මැනීමකින් පසු මෙසේ විස්තර වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය සභාවට අයත්, රාගම ඒකකය තුළ රාගම පිහිටි තේවත්ත පාර, වරිපනම් අංක 87/16 දරන "දෙල්ගහවත්ත" හෙවත් "අඹගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. බී. එල්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 2007.09.13 වැනි දින සහ අංක 8253 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 3A ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩේවිඩ් සිල්වාට අයත් ඉඩමෙන් ද, නැගෙනහිරට : ලීසන්ස් රෝහලට අයත් ඉඩමෙන් ද, දකුණට : පෞද්ගලික පාරෙන් ද සහ බස්නාහිරට : එම්. සිල්වාට අයත් ඉඩමෙන් ද, මායිම් වූ එකී අංක 8253 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහතක් (අ. 0 රූ. 0 පර්. 17) විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග පිහිටි ඉඩම වේ.

බලයලත් මිනින්දෝරු ඩබ්. බී. එල්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 2007.09.13 වැනි දින සහ අංක 8253 දරන පිඹුරට 2007.09.27 දින යොදන ලද පිටසන අනුව සලකුණු කොට ඇති ලොට් එක්ස් දරන පෞද්ගලික පාරක් සඳහා වන මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
සමාගම් ලේකම්.

07-408